Article 12(1).

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2025.02.10

පැමිණිලි පාර්ශවය :

1. පී. ඒ. නන්දසේන මයා
   නො. 305/ඒ, අලුත්ගම, බිදුණුවැව, බණ්ඩාරවෙල.

2. ඩී. එම්. තිලක් ජයවර්ධන මයා
   නෙළුගහ, හරස් බැද්දෙදිය, වලපනේ, නුවරඑළිය.

3. ඩබ්. එම්. ප්‍රියන්ති විජේසූරිය මිය
   ගෙදර අරාව, යල්පත්වෙල, වැලිමඩ.

4. එම්. එම්. සන්ධ්‍යා පොඩිමැණිකේ මිය
   ස්වර්ණ සෙවණ, ගිරාබේ, නුගතලාව.

5. ඩබ්. ඩී. සෝමසිරි මයා
   ගල්පොත්තේ අරාව, කැටකැල්ල, වැලිමඩ.

6. ඩී. එම්. එස්. මාලගමගේ
   නො. 273/10, වතුමුල්ල පාර, අස්ගිරිය, ගම්පහ.

7. ඒ. ජී. වීරකෝන් මයා
   නො. 46/1, නව ගම්මානය, කයබිලිය, දියතලාව.

8. ඒ.ජී. ඩිංගිරිමහත්මයෝ
   පල්ලේ ගෙදර, දුනුකේදෙණිය.

9. ජී. සිරිපාල මයා
   අතුළ ජයන්ත, මහින්ද පාර, නුවරඑළිය.

10. එම්. රාජරත්නම්
    සෙන් ජෝන්ස් වත්ත, කඳපොළ.

11. එම්. ඒ. කළ්‍යාණි මිය
    නො. 93, එල්ක්ප්ලේන්, රුවන්එළිය, නුවරඑළිය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

12. ඒ. එම්. කුසුමාවතී මිය
    ගංගරාගොල්ල, මඩුල්ල, උඩපුස්සැල්ලාව.

13. සී. එම්. නෝනා රම්ජානා මිය
    නො.04, සමන්පුර, බංගලාහත, නානුඔය, නුවරඑළිය

14. ආර්. එම්. ප්‍රේමාවතී මිය
    නො. 45 සී, වදගොල්ලපතන, කුරුදුගොල්ල, අඹගස්දෝව.

15. ඩබ්. වී. චන්ද්‍රලතා මිය
    දාටහණ, විල්පිට, බලංගොඩ.

16. හේමා ඩයස් මිය
    නො. 515/බී, නුවර පාර, වලපනේ.

17. ඩී. එම්. සේනානායක
    පරණ කුරුගම පාර, හීනපහුව, වැල්ලවාය.

18. ඥාණලෙච්චමී මිය
    ඩෙල්මොරල් වතුයාය, අගරපතාන.

19. සීනි අම්මා මිය
    ග්‍රේට් වෙස්ටර්න්, තලවකැළේ.

20. ගෞරි රාණි මිය
    ඊ. සෙයිවනි, ෆ්‍රෝඩ් හූස්, කඳපොළ.

21. ආර්.කේ.ඩී.එස්. රණවීර මිය
    නො. 251/78, නිඹුල්ගොඩ, යක්කල.

වගඋත්තර පාර්ශවය :

1. විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මයා (අක්ෂි සැත්කම සිදුකළ වෛද්‍යවරයා)
   නුවරඑළිය රෝහල

2. විශේෂඥ වෛද්‍ය ජේ. ඩී. ඩයස් මයා (අක්ෂි සැත්කම සිදුකළ වෛද්‍යවරයා)
   ගම්පහ රෝහල

3. රෝහල් අධ්‍යක්ෂ
   නුවරඑළිය දිස්ත්‍රික් මහරෝහල

4. රෝහල් අධ්‍යක්ෂ
   ගම්පහ දිස්ත්‍රික් මහරෝහල

5. සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
   සෞඛ්‍ය අමාත්‍යාංශය

6. සභාපති
   ජාතික ඖෂධ නියාමන අධිකාරිය

7. ලේකම්
   සෞඛ්‍ය අමාත්‍යාංශය

**පැමිණිලිඅංක : HRC-2873-23/ HRC-3106-23/ HRC-2877-23/ HRC-2888-23/HRC-2921-23 HRC-3095-23/ HRC/1400/24**

පැමිණිල්ල :

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2023.07.02 දිනැතිව උක්ත අංක යටතේ නුවරඑළිය මහරෝහල සහ ගම්පහ මූලික රෝහලේ දී සිදුකරන ලද අක්ෂි ශෛල්‍ය කර්මයක් හේතුවෙන් ඇසේ පෙනීම අහිමිවීම සම්බන්ධයෙන් ලිඛිත පැමිණිලි කිහිපයක් යොමුකර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නුවරඑළිය මහරෝහල සහ ගම්පහ රෝහල, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් වාර්තාවන් කැඳවන ලදි. මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි නවයක් පමණක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වී තිබුණ ද කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විමර්ශනවලදී මෙම අක්ෂි ශෛල්‍ය කර්මය හේතුවෙන් ඇස් අන්ධභාවයට පත්වූ සමස්ථ රෝගීන් ගණන 21 දෙනෙකුට වඩා වැඩි බව අනාවරණය විය. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ ඇතුළත්වී ඇත්තේ වින්දිතයන් 18 දෙනෙකුගේ නම් පමණි. එම ලේඛනයේ නම ඇතුළත් නොවූ ඩී. එම්. එස්. මාලගමගේ මිය, ඒ. ජී. වීරකෝන් මයා සහ ආර්. කේ.ඩී.එස්. රණවීර මිය යන රෝගීන් තිදෙනා ද මෙකී සිදුවීම හේතුවෙන් ඇස් අන්ධභාවයට පත්වූ පුද්ගලයන් බවට කොමිෂන් සභාවට පැමිණිලි යොමුකර ඇත. මෙහි ඩී. එම්. එස්. මාලගමගේ සහ ආර්.කේ.ඩී.එස්. රණවීර මිය යන රෝගීන් ගම්පහ රෝහලේදී අක්ෂි ශල්‍යකර්මය කරගත් බවට එම රෝහල මගින් වාර්තා කර ඇත. ඒ. ජී. වීරකෝන් යන අය නුවරඑළිය මහරෝහලේදී ප්‍රතිකාර ලබාගෙන ඇති බවට පැමිණිලිකර ඇති නමුත් එම අයගේ නම ලේඛනවල සඳහන්වී නොමැත. කෙසේනමුත් මෙම සිදුවීම හේතුවෙන් 21 දෙනෙකුගේ පමණ ඇස් අන්ධභාවයට පත්වී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය විය. එම තොරතුරු පහත පරිදි වේ.

- නුවරඑළිය මහරෝහල සහ ගම්පහ මහරෝහල්වල අක්ෂි සැත්කම් වලට භාජනයවී ඇස් අන්ධභාවයට පත්වූ වින්දිතයන් පිළිබඳ විස්තර

| | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ වින්දිතයන් | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද වාර්තාවේ සඳහන් වින්දිතයන් |
|---|---|---|
| 01 | පී. ඒ. නන්දසේන මයා | නම සඳහන් වේ. |
| 02 | ඩී. එම්. තිලක් ජයවර්ධන මයා | |
| 03 | ඩබ්. එම්. ප්‍රියන්ති විජේසූරිය මිය | |
| 04 | එම්. එම්. සන්ධ්‍යා පොඩිමැණිකේ මිය | |
| 05 | ඩබ්. ඩී. සෝමසිරි මයා | |
| 06 | ඩී. එම්. එස්. මාලගමගේ මයා | නම ඇතුළත්වී නොමැත. ගම්පහ රෝහලෙන් සැත්කම් සිදුකර ඇත. (මේවන විට ලේඛනයට නම අතුලත් කර ඇති බව පැමිණිලිකරුවන් ප්‍රකාශ කරයි) |
| 07 | ආර්.කේ.ඩී.එස්. රණවීර මිය | |
| 08 | ඒ. ජී. වීරකෝන් මයා | නම ඇතුළත්වී නොමැත |
| 09 | කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර නොමැත | ඒ.ජී. ඩිංගිරිමහත්මයෝ |
| 10 | | ජී. සිරිපාල මයා |
| 11 | | එම්. රාජරත්නම් |
| 12 | | එම්. ඒ. කළ්‍යාණි මිය |
| 13 | | ඒ. එම්. කුසුමාවතී මිය |
| 14 | | සී. එම්. නෝනා රම්ජානා මිය |
| 15 | | ආර්. එම්. ප්‍රේමාවතී මිය |
| 16 | | ඩබ්. වී. චන්ද්‍රලතා මිය |
| 17 | | හේමා ඩයස් මිය |
| 18 | | ඩී. එම්. සේනානායක |
| 19 | | ඥාණලෙච්චමී මිය |
| 20 | | සීනි අම්මා මිය |
| 21 | | ගෞරි රාණි මිය |

- ඉහත නම් සඳහන් වින්දිතයන් වෙතින් දිවුරුම් ප්‍රකාශ කැඳවීම පිළිබඳ විස්තර

| | දිවුරුම් ප්‍රකාශ කැඳවූ වින්දිතයන්ගේ නම් | දිවුරුම් ප්‍රකාශ යොමු කිරීම | දුරකථන මාර්ගයෙන් විමසීම |
|---|---|---|---|
| 01 | පී. ඒ. නන්දසේන මයා | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර ඇත. | |
| 02 | ඩී. එම්. තිලක් ජයවර්ධන මයා | | |
| 03 | ඩබ්. එම්. ප්‍රියන්ති විජේසූරිය මිය | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0750331479 දරණ දුරකථන අංකයට 2024.12.10 දින දුරකථනයෙන් විමසීමක් සිදුකරන ලදි. |
| 04 | එම්. එම්. සන්ධ්‍යා පොඩිමැණිකේ මිය | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර ඇත. | |
| 05 | ඩබ්. ඩී. සෝමසිරි මයා | | |
| 06 | ඩී. එම්. එස්. මාලගමගේ මයා | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0762922472 දරණ දුරකථන අංකයට 2024.12.10 දින දුරකථනයෙන් විමසීමක් සිදුකරන ලදි. |
| 07 | ආර්.කේ.ඩී.එස්. රණවීර මිය | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0743812496 දරණ දුරකථන අංකයට 2025.01.28 දින දුරකථනයෙන් විමසීමක් සිදුකරන ලදි. |
| 08 | ඒ. ජී. වීරකෝන් මයා | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0762627923 දරණ දුරකථන අංකයට 2024.12.10 දින දුරකථනයෙන් විමසීමක් සිදුකරන ලදි. |
| 09 | ඒ.ජී. ඩිංගිරිමහත්මයෝ | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර ඇත. | |
| 10 | ජී. සිරිපාල මයා | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0718060550 දුරකථන අංකය භාවිතයේ නොමැත. |
| 11 | එම්. රාජරත්නම් | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර ඇත. | |
| 12 | එම්. ඒ. කළ්‍යාණි මිය | | |
| 16 | ඒ. එම්. කුසුමාවතී මිය | | |
| 14 | සී. එම්. නෝනා රම්ජානා මිය | | |
| 15 | ආර්. එම්. ප්‍රේමාවතී මිය | | |
| 16 | ඩබ්. වී. චන්ද්‍රලතා මිය | | |
| 17 | හේමා ඩයස් මිය | | |
| 18 | ඩී. එම්. සේනානායක | | |
| 19 | ඥාණලෙච්චමී මිය | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර නොමැත. | 0776037718 දරණ දුරකථන අංකයට 2024.12.10 දින දුරකථනයෙන් විමසීමක් සිදුකරන ලදි. |
| 20 | සීනි අම්මා මිය | දිවුරුම් ප්‍රකාශයට පිළිතුරු යොමුකර ඇත. | |
| 21 | ගෞරි රාණි මිය | | |

- උක්ත වින්දිතයන්ගේ ඇසේ පෙනීම පිළිබඳ වර්තමාන තත්ත්වය

<table>
<tr><th></th><th>වින්දිතයාගේ නම</th><th>ඇසේ පෙනීම පිළිබඳ වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>01</td><td>පී. ඒ. නන්දසේන මයා</td><td rowspan="17">ශෛල්‍යා කර්මයට භාජනය කරන ලද ඇස පූර්ණ අන්ධබාවයට පත්ව ඇත.</td></tr>
<tr><td>02</td><td>ඩී. එම්. තිලක් ජයවර්ධන මයා</td></tr>
<tr><td>03</td><td>ඩබ්. එම්. ප්‍රියන්ති විජේසූරිය මිය</td></tr>
<tr><td>04</td><td>එම්. එම්. සන්ධ්‍යා පොඩිමැණිකේ මිය</td></tr>
<tr><td>05</td><td>ඩබ්. ඩී. සෝමසිරි මයා</td></tr>
<tr><td>06</td><td>ඩී. එම්. එස්. මාලගමගේ මයා</td></tr>
<tr><td>07</td><td>ආර්.කේ.ඩී.එස්. රණවීර මිය</td></tr>
<tr><td>08</td><td>ඒ. ජී. වීරකෝන් මයා</td></tr>
<tr><td>09</td><td>එම්. රාජරත්නම්</td></tr>
<tr><td>10</td><td>එම්. ඒ. කළ්‍යාණී මිය</td></tr>
<tr><td>11</td><td>ඒ. එම්. කුසුමාවතී මිය</td></tr>
<tr><td>12</td><td>ආර්. එම්. ප්‍රේමාවතී මිය</td></tr>
<tr><td>13</td><td>ඩබ්. වී. චන්ද්‍රලතා මිය</td></tr>
<tr><td>14</td><td>හේමා ඩයස් මිය</td></tr>
<tr><td>15</td><td>ඩී. එම්. සේනානායක</td></tr>
<tr><td>16</td><td>සීනි අම්මා මිය</td></tr>
<tr><td>17</td><td>ගෞරි රාණි මිය</td></tr>
<tr><td>18</td><td>සී. එම්. නෝනා රම්ජානා මිය</td><td rowspan="2">තරමක්දුරට පෙනීම ලැබී ඇත.</td></tr>
<tr><td>19</td><td>ඒ.ජී. ඩිංගිරිමහත්මයෝ</td></tr>
<tr><td>20</td><td>ඥාණලෙව්වමී මිය</td><td>ඇස් කණ්ඩාඩි භාවිතා කරන බැවින් පෙනීම තරමක්දුරට යහපත් මට්ටමක පවතී.</td></tr>
<tr><td>21</td><td>ජී. සිරිපාල මයා</td><td>මෙම වින්දිතයා සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇත.</td></tr>
</table>

මෙම රෝගීන් වෙතින් දිව්රුම් ප්‍රකාශ කැඳවීම සිදුකරන ලදි. ඒ අනුව එම රෝගීන් 20 දෙනාගෙන් ලබාගන්නා ලද දිව්රුම් ප්‍රකාශවල සාරාංශ පහත පිරිදි වේ.

**පළමුවන වින්දිතයාගේ ප්‍රකාශය:**

නො. 305/ ඒ, අලුත්ගම, බිඳුණුවැව, බණ්ඩාරවෙල ලිපිනයේ පදිංචි **පී.ඒ. නන්දසේන** යන අය විසින් 2023.07.02 දිනැතිව පහත පරිදි ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. තමාගේ වම් ඇසට කාචයක් දැමීම සඳහා අක්ෂි ශල්‍යකර්මයක් 2023.04.05 වන දින නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේදී සිදුකළ බවත් ශෛල්‍ය කර්මයෙන් පසු 2023.04.06 දින තමා නැවත නිවසට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. තමා විසින් වෛද්‍යවරුන්ගේ නියමය පරිදි නිසි වේලාවට ඉතා පිරිසිදුව ඇසට බෙහෙත් දමන ලද නමුත්, දිනෙන් දින තමාගේ ඇසේ පෙනීම ක්‍රමයෙන් නැතිවී ඇසට හා ශරීරයට සංකූලතා මතුවූ බවත් සඳහන් කර ඇත. එසේ ඇසට බෙහෙත් දමමින් සිටියදී 2023.04.22 දින වන විට ඇස රතුවී, ඇස ඉදිමී, ශරීරයට ද උණ රෝගය වැළඳුණු බවත්, 2023.04.21 දින සවස 4.00 පමණ නුවරඑළිය මහරෝහලට දුරකථනයෙන් අමතා වෛද්‍යවරයෙකුට මේ පිළිබඳව දැනුම්දීමෙන් පසු වෛද්‍යවරයා විසින් කඩිනමින් රෝහලට පැමිණෙන ලෙස දැන්වූ අතර, එහෙත් එදින තිබූ වර්ෂාව හේතුවෙන් තමාට යාමට නොහැකි වූ බැවින් 2023.04.22 දින නැවත රෝහලේ අක්ෂි වාට්ටුවේ නගරවී ප්‍රතිකාර ලබාගත් බවත් එහිදී තමාට වෛද්‍යවරුන් වෙතින් දැනගැනීමට ලැබුණේ "ඇසට දැමූ Prednisolone Acetate Ophthalmic නැමති ඖෂධයට ඉන්දියාවේදී විෂබීජයක් ඇතුලුවීම හේතුවෙන් ඇස අන්ධවී ඇති බවයි" යනුවෙන් සඳහන් කර ඇත. එහිදී අක්ෂි සැත්කම සිදුකළ විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා තමාගේ ඇසට නැවතත් එන්නතක් ලබාදී ප්‍රතිකාර කළ අතර, දිනෙන් දින ඇසේ පෙනීම නැතිවී අන්ධභාවය වැඩිවීම හේතුවෙන් වෛද්‍යතුමා වෙතින් කොළඹ අක්ෂි රෝහලට යාමට අවසර ඉල්ලා සිටි බවත්, තමා ඒවන විට පත්ව සිටි දුෂ්කරතා හේතුවෙන් ගිලන් රථයකින් තමා පිටත්කර යවන ලෙස ඉල්ලා සිටිය ද, එය ඉටුනොවූ බැවින් තමාගේ පෞද්ගලික වියදමින් කොළඹ අක්ෂි රෝහල වෙත 2023.05.04 දින පැමිණ විශේෂඥ වෛද්‍ය කපිල බන්දුල මහතාගේ වාට්ටුවේ නේවාසිකව දින 15 ක් නතරවී විශේෂ ප්‍රතිකාර ලබාගත් නමුත් මේවන විටත් තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී අන්ධභාවයට පත්වී ඇති බව වෛද්‍යවරු ප්‍රකාශ කළ බවත් තමාගේ ඇස් අන්ධවීම හේතුවෙන් ඉතා අසරණ තත්ත්වයකට පත්ව සිටින බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ ඉහත නම් සඳහන් වින්දිතයාගේ නම ඇතුළත්වී ඇත. ඒ අනුව එම පැමිණිල්ලට අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් 2024.08.08 දිනැතිව දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.21 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බව ප්‍රකාශ කර තිබේ.

**දෙවන වින්දිතගේ ප්‍රකාශය :**

නෙළුගහ, හරස් බැද්දෙදිය, වලපනේ, නුවරඑළිය යන ලිපිනයේ පදිංචි **ඩී. එම්. තිලක් ජයවර්ධන** යන අය විසින් 2023.07.02 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමාගේ ඇසේ සුද මතුවීම හේතුවෙන් 2023.04.04 දින අක්ෂි ශල්‍යකර්මය සිදුකිරීම සඳහා නුවරඑළිය මහරෝහලට ඇතුළත්වූ බවත් 2023.04.05 වන දින එම ශල්‍යකර්මය සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම අක්ෂි ශල්‍යකර්මය විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් සිදුකළ බවත් ශල්‍යකර්මය සිදුකිරීමෙන් පසු 2023.04.06 දින නැවත නිවසට ගිය බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මය සිදුකර දින 08 පමණ පසු ශෛල්‍ය කර්මයට භාජනය කරන ලද ඇසෙන් කඳුළු ගැලීම, හිසෙහි වේදනාව, ඇසේ වේදනාව වැඩි වූ බවත් මෙම ආසාදිත තත්ත්වයන් සඳහා වෛද්‍ය උපදෙස් ලබාගැනීම සිදුකර ඇත. මෙම ශල්‍යකර්මය හේතුවෙන් ඇසේ පෙනීම නැතිවී ගිය බැවින් ඒ සඳහා ශල්‍යකර්මය කිහිපයක් සිදුකළ නමුත් මේවන විට සම්පූර්ණයෙන්ම පෙනීම අහිමිවී ඇති බවත් කාච පැළඳීම කළ යුතු බව වෛද්‍ය නිර්දේශය වූ බැවින් කාච දැමීම සිදු කළ ද ඉහත සඳහන් ආසාද්මික තාවයන් තවමත් පවතින බවත් ඇසේ පෙනීම නැතිවී තමා අන්ධභාවයට පත්වී ඇති බවත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී ඇත. ඒ අනුව එම පැමිණිල්ලට අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිව්රුම් ප්‍රකාශයක් මගින් යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් 2024.08.08 දිනැතිව දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.19 දිනැතිව දිව්රුම් ප්‍රකාශයක් යොමුකරමින් තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බව ප්‍රකාශ කර තිබේ.

**තෙවන වින්දිතගේ ප්‍රකාශය :**

ගෙදර අරාව, යල්පත්වෙල, වැලිමඩ ලිපිනයෙහි පදිංචි **ඩබ්. එම්. ප්‍රියන්ති විජේසූරිය** යන අය විසින් 2023.07.10 දිනැතිව පහත පරිදි ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. තමාගේ වම් ඇස සඳහා කාචයක් දැමීමේ අක්ෂි ශල්‍යකර්මය සඳහා නුවරඑළිය මහරෝහලේ 2023.04.04 යන දින රෝහල්ගත වූ බවත්, 2023.04.05 යන දින එකී ශෛල්‍ය කර්මය සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම ශෛල්‍ය කර්මය සිදුකිරීමෙන් පසු තමාගේ ඇසට ඇතිවූ අසාද්මිතකාවයන් හේතුවෙන් 2023.04.28 යන දින තෙක් දින 24 ක් රෝහල්ගතව ප්‍රතිකාර ලැබූ බවත්, එම කාලය තුළ ඇසට යොදන කිසිදු බෙහෙතක් රෝහලෙන් තමාහට නොලැබුණු බවත් තමාගේ පෞද්ගලික වියදමින් ඒවා ලබාගැනීමට සිදුවූ බැවින් තමා ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇති බවත් ප්‍රකාශ කර ඇත. තමාට දෙවන වරට 2023.05.12 දින රෝහල්ගතවීමට සිදුවූ බවත් එහිදී ඇසේ විසබීජ ඇති බැවින් ඒවා ඉවත් කිරීමට දින 11 ක් රෝහල්ගතවී ප්‍රතිකාර ගැනීමට සිදුවූ බවත් සඳහන් කර ඇත. එම ප්‍රතිකාර වලින් පසු ද තමාගේ ඇසේ පෙනීම නැවත නොලැබුණ බවත් ඇසේ පෙනීම නොමැතිවීම හේතුවෙන් තමා ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බව ප්‍රකාශ කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී ඇත. ඒ අනුව එම පැමිණිල්ලට අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් 2024.08.08 දිනැතිව දැනුම්දී ඇත. එයට ප්‍රතිචාර දක්වා නොමැති බැවින් 2024.12.10 දින දුරකථන මාර්ගය ඔස්සේ ඇසේ පෙනීම පිළිබඳ වර්තමාන තත්ත්වය විමසා සිටින ලදි. එහිදී තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බව ප්‍රකාශ කරන ලදි.

**සිව්වන වින්දිතගේ ප්‍රකාශය :**

ස්වර්ණ සෙවන, ගිරාබේ, නුගලතාව යන ලිපිනයෙහි පදිංචි **එම්. එම්. සන්ධ්‍යා පොඩිමැණිකේ** යන අය විසින් 2023.07.10 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමාගේ ඇසේ සුද ඉවත් කිරීම හා ඇසට කාචයක් දැමීමේ ශෛල්‍ය කර්මය සඳහා තමා 2023.04.04 වන දින නුවරඑළිය මහරෝහලට ඇතුළත් වූ බවත්, 2023.04.05 වන දින ඇසේ කාචය දැමීමේ ශල්‍යකර්මය සිදු කළ බවත් ප්‍රකාශ කර ඇත. ශල්‍යකර්මය සිදු කළ ද පසුදින තමාගේ ඇසේ පෙනීම නොලැබුණ බැවින් නැවත ශල්‍යකර්මය කිරීම සඳහා තමා දින දෙකක් ලබාගත් බවත්, වෛද්‍යවරු විසින් තමාගේ ඇසට ප්‍රතිකාර කර ඇසේ පෙනීම ගැනීමට වෛද්‍යවරු බොහෝ උත්සාහ කළ නමුත් ඇසේ පෙනීම නැවත ලබාගැනීමට නොහැකිවූ බවත් සඳහන් කර ඇත. තමාගේ ඇසට සිදු කළ ශල්‍යකර්මයෙන් පසු විවිධ ශාරීරික අපහසුතා ද ඇතිවී ඇති අතර තමා ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී ඇත. ඒ අනුව එම පැමිණිල්ලට අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් 2024.08.07 දිනැතිව දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.16 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බව ප්‍රකාශ කර තිබේ.

**පස්වන වින්දිතගේ ප්‍රකාශය :**

ගල්පොත්තේ අරාව, කැටකැල්ල, වැලිමඩ යන ලිපිනයෙහි පදිංචි **ඩබ්. ඩී. සෝමසිරි** යන අය විසින් 2023.07.02 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමා 2023.04.04 වන දින තමාගේ ඇසට කාචයක් දැමීමේ ශල්‍යකර්මය සඳහා නුවරඑළිය රෝහලට ඇතුළත් වූ බවත් 2023.04.05 වන දින තමාගේ වම් ඇසට කාචයක් දැමීමේ ශල්‍යකර්මය පසු 2023.04.06 වන දින තමා රෝහලෙන් පිටව ගිය බවත් ප්‍රකාශ කර ඇත. 2023.05.15 දින තමාගේ කාචය දැමූ ඇස රතුවී කඳුළු ගැලීම හේතුවෙන් තමා නැවත නුවරඑළිය රෝහලට ඇතුළත් වූ බවත්, එතැන් සිට දින 07 ක් නේවාසිකව ඇසට ප්‍රතිකාර කළ බවත්, එම ප්‍රතිකාර වලින් පසු ස්වල්ප

වශයෙන් ඇසේ පෙනීම ඇතිවූ බැවින් 2023.05.23 වන දින නැවතත් තමා නිවසට පැමිණි බවත් සඳහන් කර ඇත. එහෙත් නැවතත් තමාගේ ඇසේ පෙනීම නැතිවූ බැවින් 2023.06.05 වන දින නැවතත් තමා නුවරඑළිය රෝහලට ඇතුළත් වුවූ බවත් 2023.06.07 වන දින තමා කොළම අක්ෂි රෝහල වෙත මාරුකළ බවත්, එහිදී ඇසට ප්‍රතිකාර කළ අතර 2023.06.16 වන දින නැවත ශල්‍යකර්මයක් සිදුකළ අතර, එදින සිට දින 05 කට පසු එනම් 2023.06.21 දින තමා නැවත නිවසට පැමිණි බවත් එදින සිට අක්ෂි සායන වලට සහභාගී වන නමුත් මේවන විට ඇසේ පෙනීම නැතිවී අන්ධභාවයට පත්ව සිටින බවත් මෙම ශල්‍යකර්මය හේතුවෙන් ඇසේ පෙනීම නැතිවී ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී ඇත. ඒ අනුව එම පැමිණිල්ලට අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් යොමුකරන මෙන් කොමිෂන් සභාව විසින් 2024.08.07 දිනැතිව දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.16 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන්ම නැතිවී ඇති බව ප්‍රකාශ කර තිබේ.

**හය වින්දිතගේ ප්‍රකාශය :**

අංක 273/10, වතුමුල්ල පාර, අස්ගිරිය, ගම්පහ යන පිලිනයෙහි පදිංචි **ඩී.එම්.එස්.** මාලගමගේ යන අය අය විසින් 2023.07.28 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමා ගම්පහ දිස්ත්‍රික් රෝහලේදී 2023.04.06 වන දින ඇසට කාචයක් දැමීමේ ශල්‍යකර්මයකට භාජනය කළ අතර, ශල්‍යකර්මයෙන් දින කිහිපයකට පසුව ඇසෙහි පෙනීම ක්‍රමානුකූලව නැතිවූ හෙයින්, මා නැවත 2023.04.12 දින ගම්පහ රෝහලට ඇතුළත්වී 2023.04.20 දින දක්වා ප්‍රතිකාර ලබමින් සිට අතර, පසුව කොළඹ අක්ෂි රෝහල වෙතට මාරුකර යැවූ බවත් තමා මේ දක්වා ප්‍රතිකාර සහ සැත්කම් කිහිපයකට භාජනය කරන ලද නමුත් තමාගේ ඇසේ පෙනීම නැතිවී ඇස අන්ධවී ඇති බවත් සඳහන් කර ඇත.

මෙම වින්දිතයා ගම්පහ මහරෝහල තුළ අක්ෂි සැත්ක් සිදුකර ඇස් අන්ධවී ඇති බවට කොමිෂන් සභාවට පැමිණිලි කර තිබේ. ඒ සම්බන්ධයෙන් ගම්පහ රෝහල මගින් වාර්තාවක් යොමුකර ඇත. වගඋත්තර පාර්ශවය විසින් මෙකී වින්දිතයා එම රෝහලෙහි ශෛල්‍ය කර්මයට භාජනය කරන ලද බව පිළිගෙන තිබේ.

එහෙත් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී නොමැත. එබැවින් 2024.12.10 දිනැතිව කොමිෂන් සභාව විසින් වින්දිතයා වෙත දුරකථන ඇමතුමක් ලබාදී මේ පිළිබඳව විමසීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිල්ලක් යොමුකර ඇති බවත් අදාළ ලේඛනයට මේවන

විට නම ඇතුළත් කර ඇති බවත් සඳහන් කරන ලදි. තවද මේවන විට ඇසේ පෙනීම නැතිවී ඇති බව ප්‍රකාශ කරන ලදි.

**හත්වන වින්දිතගේ ප්‍රකාශය :**

නො. 251/78, කිඹුල්ගොඩ, යක්කල යන ලිපිනයෙහි පදිංචි ආර්.කේ.ඩී.එස්. රණවීර යන අය විසින් 2024.08.20 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමාගේ දකුණු ඇසට කාචයක් බද්ධ කිරීම සඳහා ශල්‍යකර්මයක් සිදුකිරීමට 2023.04.05 දින ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලට ඇතුළත් වූ බවත්, ශෛල්‍ය කර්මය සිදුකිරීමෙන් පසු 2023.04.07 දින නිවස බලා පිටත්ව ගිය බවත් සඳහන් කර ඇත. 2023.04.13 දින රෝහලේ අක්ෂි සායනය වෙත ගිය අවස්ථාවේ දී මෙම ශල්‍යකර්මය සිදු කිරීමේ දී විෂබීජ ඇසට ඇතුළුවී ඇති බැවින් නැවත රෝහලට ඇතුළත්වන ලෙස දැන්වූ බවත් ඉන් පසු 2023.04.20 දින දක්වා ප්‍රතිකාර ලබාදුන්න ද ඇසේ පෙනීම නොලැබුණු බැවින් කොළඹ අක්ෂි රෝහල වෙත මාරු කර යැවූ බව සඳහන් කර ඇත. එහිදී ලබාදුන් ප්‍රතිකාර මගින් ඇසේ පෙනීම නොලැබුණු බැවින් 2023.05.03 දින රෝහලෙන් නිවසට පිටත්ව ගිය බවත් සඳහන් කර තිබේ. මේවන තෙක් අක්ෂි සායන සඳහා සහභාගී වුව ද මේවන තෙක් ඇසේ පෙනීම නොලැබීම හේතුවෙන් ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී නොමැත. මේ සම්බන්ධයෙන් 2025.01.28 දිනැතිව කොමිෂන් සභාව විසින් වින්දිතයා වෙත දුරකථන ඇමතුමක් ලබාදී මේ පිළිබඳව විමසීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිල්ලක් යොමුකර ඇති බවත් මේවන විට ඇසේ පෙනීම නැතිවී ඇති බව ප්‍රකාශ කරන ලදි.

ගම්පහ රෝහල මගින් අක්ෂි සැත්කම් සිදුකරන ලද මෙම අය සම්බන්ධයෙන් 2025.01.30 දිනැතිව ගම්පහ දිස්ත්‍රික් රෝහල් අධ්‍යක්ෂ වෙතින් වාර්තාවක් කැඳවන ලදි. ඒ අනුව 2025.02.05 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාවක් යොමුකරමින්, මෙම වින්දිතයා ගම්පහ රෝහලේ දී 2023.04.05 දින සිට 2023.04.07 දක්වා අක්ෂි සැත්කමක් සිදුකිරීමට ඇතුළත් වී ඇති බවත්, එම ශල්‍යයකර්මය සඳහා භාවිතා කරන ලද Prednisolone Acetate 1% ඖෂධය හේතුවෙන් මෙ අයගේ දකුණු ඇස අන්ධභාවයට පත්වී ඇති බවත් සඳහන් කර ඇත.

**අටවන වින්දිතගේ ප්‍රකාශය :**

අංක 46/1, නව ගම්මානය, කහඹිලිය, දියතලාව යන ලිපිනයෙහි පදිංචි **අනුර ගුණරත්න වීරකෝන්** යන අය විසින් 2023.03.08 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමා නුවරඑළිය මහරෝහල වෙත අක්ෂි ශල්‍යකර්මයක් සඳහා ඇතුළත් වූ බවත් එහිදී ඇසට යොදන ලද බෙහෙත් හේතුවෙන් ඇසේ පෙනීම නැතිවී ගිය බවත් සඳහන් කර ඇති නමුත්, නුවරඑළිය මහරෝහල මගින් කොමිෂන් සභාව වෙත 2024.07.19 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම්

ලැයිස්තුවේ මෙම වින්දිතයාගේ නම සඳහන් වී නොමැත. කෙසේනමුත් පැමිණිලිකරුගේ මුල් පැමිණිල්ල පහත පරිදි වේ. තමා බණ්ඩාරවෙල සියස් (පුද්) සායන මධ්‍යස්ථානයේදී 2023.03.10 වන දින නුවරඑළිය මහරෝහලේ අක්ෂි විශේෂඥ වෛද්‍යවරයෙකු වන රෝහණ එදිරිසිංහ මහතා වෙත යොමුවී අක්ෂි පරීක්ෂාවක් සිදුකර ගත් බවත්, එහිදී එතුමා විසින් තමාගේ දකුණු ඇසේ සුද ඇතිවී ඇති බැවින් එය ඉවත් කිරීම සඳහා ශල්‍යකර්මයක් කළ යුතු බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. ඒ සඳහා 2023.04.04 වන දින නුවරඑළිය මහරෝහලට ඇතුළත් වන ලෙස දැනුම්දී ඇත. ඒ අනුව තමා නුවරඑළිය මහරෝහල වෙත ඇතුළත් වූ බවත් 2023.04.05 වන දින ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සඳහා සූදානම් වන ලෙස පවසා උදෑසන 5.00 ට පමණ ඇසට බෙහෙත් වාර දෙකක් දැමූ බවත්, පසුව උදෑසන 10.00 පමණ නැවත තමාගේ පාදයේ තුවාළයක් ද තිබූ බැවින් ඇසේ ශල්‍යකර්මය සිදු කළ නොහැකි බව පවසා ඇති බව සඳහන් කර ඇත.පසුව එදින සවස 1.00 ට පමණ රෝහලෙන් පිටව යාම සඳහා රෝහල් කාර්යය මණ්ඩලය විසින් කටයුතු සූදානම් කරදුන් බව සඳහන් කර ඇත. තමා නිවසට පැමිණි පසු තමාගේ ඇස දෙක තද රිදුම් සහිත ස්වභාවයක් ඉසිලූ බවත්, දින දෙකක් පමණ ගතවන විට තමාගේ ඇස් දෙකම තදින් රතුවී කඳුළු ගලන්නට වූ බවත්, ඉන් පසු සතියක් පමණ ගතවන විට ටිකෙන් ටික තමාගේ ඇස් දෙක බොඳවී නොපෙනී යන්නට වූ බවත් සඳහන් කර ඇත. නැවතත් තමා 2023.05.27 දින බණ්ඩාරවෙල සියස් (පුද්) සායන මධ්‍යස්ථානය වෙත ගිය බවත්, එහිදී විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් ඇසට විසබීජයක් ගොස් ඇති බැවින් නුවරඑළිය රෝහලට නැවත යොමුවීමෙන් ප්‍රතිඵලයක් නොමැති බවත් දකුණු ඇසට කාචයක් දැමීමෙන් නැවත ඇසේ පෙනීම ලබාගත හැකි බවත් ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව 2023.06.25 දින දකුණු ඇස සඳහා රු. 12000.00 පමණ වියදමින් කාචයක් දැමීම සිදුකළ බවත්, එහෙත් එම කාචය දැමීමෙන් ද ඇස් පෙනීම නොලැබුණු බවත් තමා නැවත වෛද්‍යවරයා වෙත යොමුවූ අතර එහිදී වෛද්‍යවරාය විසින් තමාගේ ඇස් දෙකේම ස්නායු දුරුවලවී ඇති බැවින් නැවත පෙනීම ලබාගැනීමට නොහැකි බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. විෂබීජ සහිත බෙහෙත් රෝහල මගින් තමාගේ ඇසට දැමීම හේතුවෙන් තමා පූර්ණකාලීන අන්ධබාවයට පත්වී ඇති බවත් ඇස් අන්ධවීම හේතුවෙන් තමා ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව වෙත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ඇතුළත් ලේඛනයේ මෙකී වින්දිතයාගේ නම ඇතුළත්වී නොමැත. මේ සම්බන්ධයෙන් 2024.12.10 දිනැතිව කොමිෂන් සභාව විසින් වින්දිතයා වෙත දුරකථන ඇමතුමක් ලබාදී මේ පිළිබඳව විමසීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිල්ලක් යොමුකර ඇති බවත් මේවන විට ඇසේ පෙනීම නැතිවී ඇති බව ප්‍රකාශ කරන ලදි.

**නවවන වින්දිතගේ ප්‍රකාශය :**

පල්ලේ ගෙදර, දුනුකේදෙණිය යන ලිපිනයේ පදිංචි **ඒ.ජී. ඩිංගිරි මහත්මයෝ** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිව්රුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.07 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.15 දිනැතිව දිව්රුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

තමාගේ දකුණු ඇසෙහි සුද ඇතිවීම හේතුවෙන් නුවරඑළිය මූලික රෝහලට 2023.04.04 වන දින ඇතුළත් වූ බවත් 2023.04.05 වන දින විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් තමාගේ අක්ෂි සැත්කම සිදුකළ බවත් සඳහන් කර ඇත. සැත්කම සිදුකිරීමෙන් පසු ඇසේ පෙනීම තිබූ බැවින් 2024.04.06 දින රෝහලෙන් පිටත්කර හැරී බවත් 2023.04.13 දින ඇසේ පෙනීම නැතිවී ගිය අතර ඒ පිළිබඳව වෛද්‍යවරයා දැනුවත් කළ පසු නැවත රෝහල් ගත වන ලෙස දැනුම්දුන් බැවින් 2023.04.13 දින සවස රෝහලට ඇතුළත් වූ බවත් සඳහන් කර ඇත. එහිදී ඇසේ තත්ත්වය තවදුරටත් ගැටලුකාරී වූ බැවින් 2023.05.03 දින මහනුවර මහරෝහලට තමා මාරුකර යැවූ බවත්, ඉන් පසු 2023.05.11 දින නැවත අක්ෂි සැත්කමක් සිදු කළ බවත් සඳහන් කර ඇත. එම සැත්කමෙන් පසු තරමක පෙනීමක් ලැබුණු බවත් 2023.05.19 දින නිවසට පැමිණි බවත් සඳහන් කර ඇත. පසුව මහනුවර මහරෝහලේ අක්ෂි සායන සඳහා යොමුවූ බවත් මේවන විට ඇසේ පෙනීම තරමක් යහපත් තත්ත්වයේ පවතින බවත් සඳහන් කර ඇත.

**දසවන වින්දිතගේ ප්‍රකාශය :**

මහින්ද පාර, නුවරඑළිය යන ලිපිනයේ පදිංචි **ජී. සිරිපාල** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිව්රුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.07 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එහෙත් අදාළ කාලසීමාව තුළදී කොමිෂන් සභාව වෙත වින්දිතයා විසින් පිළිතුරු යොමුකර නොමැත. එබැවින් ලේඛනයේ සඳහන් කර තිබූ දුරකථන අංකය ඇමතුව ද එම දුරකථන අංකය භාවිතයේ නොමැති අංකයක් බවට සටහන්වන බැවින් මෙම වින්දිතයා සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වී ඇත.

**එකොළොස්වන වින්දිතගේ ප්‍රකාශය :**

සෙන් ජෝන්ස් වත්ත, කඳපොළ යන ලිපිනයේ පදිංචි **එම්. රාජරත්නම්** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිව්රුම් ප්‍රකාශයක්

මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.23 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

තමාගේ වම් ඇසේ සුද මතුවීම හේතුවෙන් ඒ සඳහා ශල්‍යකර්මයක් 2023.04.05 වන දින නුවරඑළිය මහරෝහලේදී සිදුකළ බවත් එම සැත්කම එම රෝහලේ විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් සිදුකළ බවත් සඳහන් කර ඇත. මෙම ශල්‍යකර්මයෙන් පසු විවිධ ආසාධන ඇතිවූ බැවින් නැවත රෝහල්ගත වුවත් දින 14 පමණ පසු තමාගේ ඇසේ පෙනීම සම්පූර්ණයෙන් නැතිවූ බවත් තමා ගොවිතැන් කර ජීවත් වූ බැවින් දැනට පූර්ණ අන්ධභාවයට පත්වීම හේතුවෙන් ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

**දොළොස්වන වින්දිතගේ ප්‍රකාශය :**

අංක 93, එල්ක්ප්ලේන්, රුවන්එළිය, නුවරඑළිය යන ලිපිනයෙහි පදිංචි **එම්. ඒ. කළ්‍යාණි** යන යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.07 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.26 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ දකුණු ඇස කාවයක් දැමීම සඳහා 2023.04.04 දින නුවරඑළිය මහරෝහල වෙත ඇතුළත් වූ බවත් 2023.04.05 දින අක්ෂි ශල්‍යකර්මය සිදුකළ බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මයෙන් පසු ඇසේ අධික වේදනාවක් ඇතිවූ බැවින් නැවත නුවරඑළිය රෝහළට ඇතුළත් වූ බවත් එහිදී තමා මහනුවර මහ රෝහල වෙත මාරුකර යැවූබවත් සඳහන් කර ඇත. මහනුවර මහරෝහලේදී 2023.05.11 දින තමාගේ ඇසට නැවත ශල්‍යකර්මයක් සිදුළ බවත් එම ශල්‍යකර්මයෙන් පසු මාස 02 පමණ කාලයක් තමා රෝහල්ගත වී ප්‍රතිකාර ලගබාගත් නමුත් තමාගේ ඇසේ පෙනීම නැවත ලබාගැනීමට නොහැකිවූ බව සඳහන් කර ඇත. තමාගේ සැමියා මියගොස් ඇති බැවින් ඇස අන්ධවීම සමග තමා ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

**දහතුන්වන වින්දිතගේ ප්‍රකාශය :**

ගංගරාගොල්ල, මඩුල්ල, උඩපුස්සැල්ලාව යන ලිපිනයෙහි පදිංචි **ඩබ්. ඒ. එම්. කුසුමාවතී** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.17 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ ඇසේ පෙනීම දුර්වල වූ

බැවින් නුවරඑළිය මහ රෝහලේ සායනවලට සහභාගී වූ බවත් එහිදී ඇසට කාචයක් දැමීම සිදුකළ යුතු බවට තීරණය වූ බැවින් 2023.04.04 දින නුවරඑළිය මහ රෝහලට ඇතුළත් වූ බවත්, 2023.04.05 දින විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් අක්ෂි ශල්‍යකර්මයක් සිදුකර ඇසට කාචය දැමීම සිදුකළ බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මයෙන් පසු 2023.04.06 දින නිවසට පැමිණි බවත් පසුව ඇයේ වේදනාව වැනි ආසාද්මිකතා ඇතිවූ බැවින් ඒ පිළිබඳව රෝහල දැනුවත් කළ පසු නැවත නුවරඑළිය රෝහලට ඇතුළත් වී මාසයක් පමණ කාලයක් ප්‍රතිකාර ලබාගත් බවත් තමාගේ ඇසේ පෙනීම නැවත නොලැබුණු බැවින් මහනුවර මහරෝහල වෙත තමා මාරුකර යැවූ බවත් සඳහන් කර ඇත. එහිදී තමාගේ ඇස පරික්ෂා කළ වෛද්‍යවරු නැවත ඇසේ පෙනීම ලබාගැනීමට නොහැකි බව ප්‍රකාශ කළ බවත් මේවන විට එම ඇසේ පෙනීම නැතිවී අන්ධභාවයට පත්ව ඇති බවත් සඳහන් කර ඇත. ඇසේ පෙනීම නොමැතිවීම හේතුවෙන් තමා ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**දාහතරවන වින්දිතගේ ප්‍රකාශය :**

අංක 04, සමන්පුර, බංගලාහත, නානුඔය, නුවරඑළිය යන ලිපිනයෙහි පදිංචි **සී. එම්. නෝනා රම්ජානා** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.07 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.26 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ වම් ඇසේ සුද ඇතිවීම හේතුවෙන් වෛද්‍ය උපදෙස් මත අක්ෂි කාචයක් බද්ධ කිරීමේ ශල්‍යකර්මය සඳහා 2023.04.04 දින නුවරඑළිය මහ රෝහලට ඇතුළත්වූ බවත් 2023.04.05 වන දින විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් තමාගේ අක්ෂි ශල්‍යකර්මය සිදුකළ බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මය සිදුකිරීමෙන් පසු 2023.04.06 වන දින තමා රෝහලේ සිට නිවසට පැමිණි බවත් පසුව ශල්‍යකර්මය සිදුකළ වම් ඇසෙහි ඇතිවූ අධික වේදනාව, ඇසෙන් නොකඩවා කඳුළු ගැලීම වැනි ආසාද්මිකතාවයන් ඇතිවූ බැවින් 2023.05.03 වන දින නුවරඑළිය රෝහලට ඇතුළත් වූ බවත් 2023.05.08 වන දින තමා මහනුවර මහ රෝහල වෙත මාරුකර යැවූ බවත් සඳහන් කර ඇත. මහනුවර මහරෝහලේදී අක්ෂි පරික්ෂාවන් සිදුකර නැවත නුවරඑළිය රෝහල වෙත තමා මාරුකළ බවත් එහිදී තමා 2023.05.10 දින කොළඹ අක්ෂි රෝහල වෙත මාරුකළ බවත් සඳහන් කර ඇත. එහිදී තමා මාසයක් පමණ කාලයක් නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත් දීර්ඝ කාලීනව ප්‍රතිකාර කිරීමෙන් පසු මේවන විට තරමක පෙනීමක් ලැබී ඇති බවත් තමා ඇස් කණ්නාඩි පළඳින බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**පහළොස්වන වින්දිතගේ ප්‍රකාශය :**

අංක 45 සී, වදගොල්ලපතන, කුරුඳුගොල්ල, අඹගස්දෝව යන ලිපිනයෙහි පදිංචි **ආර්. එම්. ප්‍රේමාවතී** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.20 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ දකුණු ඇසේ පෙනීම දුර්වලවීම හේතුවෙන් 2023.04.04 වන දින නුවරඑළිය මහ රෝහලට අක්ෂි ශල්‍යකර්මයක් සිදුකර ගැනීම සඳහා ඇතුළත් වූ බවත් 2023.04.05 වන දින විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් තමාගේ අක්ෂි ශල්‍යකර්මය සිදුකළ බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මය සිදුකිරීමෙන් පසු ශල්‍යකර්මය සිදුකළ ඇසේ අසාද්මික තත්ත්වයන් ඇතිවූ බැවින් නැවත නුවරඑළිය මහ රෝහලට ඇතුළත් වූ බවත් එහිදී තමා කොළඹ අක්ෂි රෝහල වෙත මාරුකර එවූ බවත් සඳහන් කර ඇත. මේ වන විට තමාගේ ඇස් පෙනීම නැතිවී ඇති බවත් ඒ හේතුවෙන් තමා ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

**දහසයවන වින්දිතගේ ප්‍රකාශය :**

දාටහණ, විල්පිට, බලංගොඩ යන ලිපිනයෙහි පදිංචි **ඩබ්. වී. චන්ද්‍රලතා** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.23 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ දකුණු ඇසේ පෙනීම දුර්වලවීම හේතුවෙන් අක්ෂි ශල්‍යකර්මයක් සිදුකිරීම සඳහා 2023.04.04 දින නුවරඑළිය මහරෝහලට ඇතුළත්වූ බවත් 2023.04.05 වන දින අක්ෂි ශල්‍යකර්මය සිදුකළ බවත් සඳහන් කර ඇත. ශල්‍යකර්මයෙන් පසු නිවසට පැමිණි පසුව ඇසේ ඇතිවූ ආසාද්මිකතාවයන් හේතුවෙන් නැවත රෝහල් ගතවී ප්‍රතිකාර ලබාගත් නමුත් මේවන විට ඇසේ පෙනීම නැතිවී තමා අන්ධභාවයට පත්වී ඇති බවත්, ඒ හේතුවෙන් තමා ඉතාම අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

**දාහත්වන වින්දිතගේ ප්‍රකාශය :**

අංක 515/බී, නුවර පාර, වලපනේ යන ලිපිනයෙහි පදිංචි **කේ. පී. හේමලතා ලෙසත් හේමා ඩයස්** ලෙසත් හඳුන්වනු ලබන යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන

මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.20 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

තමාගේ වම් ඇසෙහි ඇතිවූ පෙනීමේ දුර්වලතාවයක් හේතුවෙන් 2023.04.04 වන දින අක්ෂි කාච බද්ධ කිරීමේ ශල්‍යකර්මයක් සඳහා නුවරඑළිය මහ රෝහලට ඇතුළත් වූ බවත්, අදාළ ශල්‍යකර්මය සිදුකිරීමෙන් පසු නැවත නිවසට පැමිණි බවත් ශල්‍යකර්මය සිදුකළ වම් ඇසේ වේදනාව, කඳුළු ගැලීම වැනි ආසාදිත තත්ත්වයන් ඇතුවූ බවත් ප්‍රකාශ කර ඇත. මේ හේතුවෙන් 2023.05.16 දින නුවරඑළිය දිස්ත්‍රික් රෝහලට ඇතුළත්වී නේවාසික ප්‍රතිකාර ලබාගත් බවත්, ඇසේ ආසාදිත තත්ත්වය වැඩිවීම හේතුවෙන් 2023.05.17 දින කොළම අක්ෂි රෝහල වෙත මාරුකර යැවූ බවත් සඳහන් කර ඇත. කොළඹ අක්ෂි රෝහලේ ප්‍රතිකාර ලබා 2023.07.24 දින නැවත නිවස බලා පැමිණි බවත් මේවන විට ඇස අන්ධභාවයට පත්වී ඇති බැවින් ඉතා අසරණ තත්ත්වයට පත්ව සිටින බව සඳහන් කර ඇත.

**දහඅටවන වින්දිතගේ ප්‍රකාශය :**

පරණ කුරුගම පාර, හීනපහුව, වැල්ලවාය යන ලිපිනයේ පදිංචි **ඩී. එම්. සේනානායක** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.08.20 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

තමාගේ ඇසේ සුද මතුවීම හේතුවෙන් අක්ෂි කාචයක් බද්ධ කිරීම 2023.04.05 වන දින නුවරඑළිය මහරෝහලේදී විශේෂඥ වෛද්‍ය රෝහණ එදිරිසිංහ මහතා විසින් සිදු කළ බව සඳහන් කර ඇත. ශල්‍යකර්මයෙන් පසු 2023.04.06 දින නිවසට පැමිණි බවත් නිවසට පැමිණි පසු ශල්‍යකර්මය සිදුකළ ඇසේ අධික වේදනාව, ඇස රතුවීම වැනි ආසාද්මිකතා ඇතිවූ බැවින් 2023.04.11 දින වන විට ඇසේ පෙනීම නැතිවූ බැවින් 2023.04.24 වන දින අක්ෂි පරීක්ෂාවක් සිදුකළ අතර 2023.05.04 වන දින ඇස් පිරිසිදු කිරීමේ ශල්‍යකර්මය ශ්‍රී ජයවර්ධනපුර රෝහලේදී සිදුකළ බවත් එහෙත් එම ශල්‍යකර්මයෙන්ද ඇසේ පෙනීම නොලැබුණු බැවින් ඉතා අසරණ තත්ත්වයට පත්ව සිටින බව සඳහන් කර ඇත.

**දහනව වන වින්දිතගේ ප්‍රකාශය :**

ඩෙල්මොරල් වතුයාය, අගරපතාන යන ලිපිනයෙහි පදිංචි **ඥාණලෙච්චමී** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එහෙත් අදාළ කාලසීමාව තුළදී කොමිෂන් සභාව වෙත වින්දිතයා විසින් පිළිතුරු

යොමුකර නොතිබූ බැවින්, ලේඛනයේ සඳහන් කර තිබූ 0776037718 දරණ දුරකථන අංකය වෙත ද අමතා මෙම සිදුවීම සම්බන්ධයෙන්

මේ සම්බන්ධයෙන් 2024.12.10 දිනැතිව කොමිෂන් සභාව විසින් වින්දිතයා වෙත දුරකථන ඇමතුමක් ලබාදී මේ පිළිබඳව විමසීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිල්ලක් යොමුකර ඇති බවත් මේවන විට ඇස් කණ්ඩාඩි භාවිතා කරන බැවින් පෙනීම තරමක්දුරට යහපත් මට්ටමක පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

**විසිවන වින්දිතගේ ප්‍රකාශය :**

ග්‍රේට් වෙස්ටර්න්, තලවකැලේ යන ලිපිනයෙහි පදිංචි **සීනිඅම්මා** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.10.18 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. නුවරඑළිය මහරෝහලේ දී තමාගේ දකුණු ඇසේ ශල්‍යකර්මයක් සිදු කළ බවත් ඉන් පසුව ඇසේ ඇතිවූ ආසාද්මික තත්ත්වයන් මතු වූ බවත් මේවන විට ඇසේ පෙනීම සම්පූර්ණයෙන් නැති වී ඇති බව සඳහන් කර ඇත. මේ පිළිබඳව මහනුවර මානව හිමිකම් කාර්යාලය වෙත 2023.08.01 දින පැමිණිලි කළ බවත් 2024.04.24 දින එම පැමිණිල්ල විභාගයට ලත් බවත් වැඩිදුරටත් සඳහන් කර තිබේ. මේවන විට ඇස් දෙකෙහිම පෙනීම නැතිවී ගොස් ඇති බවත් ඖෂධ සඳහා අධික වියදමක් දැරීමට සිදුව ඇති බවත් මේ හේතුවෙන් ඉතා අසරණ තත්ත්වයට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

**විසි එක්වන වින්දිතගේ ප්‍රකාශය :**

ඊ. සෙයිවනි, ෆ්‍රෝඩ් හූස්, කඳපොළ යන ලිපිනයෙහි පදිංචි **ගෞරි රාණි** යන අයගේ නම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත 2024.08.21 දිනැතිව යොමුකරන ලද වින්දිතයන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් කර තිබූ බැවින්, අදාළ සිදුවීම සහ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය දිවුරුම් ප්‍රකාශයක් මගින් කොමිෂන් සභාව වෙත යොමුකරන මෙන් 2024.08.08 දිනැති ලිපිය මගින් වින්දිතයා වෙත දැනුම්දී ඇත. එයට පිළිතුරු ලෙස මෙම වින්දිතයා විසින් 2024.10.21 දිනැතිව දිවුරුම් ප්‍රකාශයක් යොමුකරමින් මෙසේ ප්‍රකාශ කර ඇත. තමාගේ වම් ඇසේ කාචයක් දැමීම සඳහා 2023.04.04 දින නුවරඑළිය මහරෝහලට ඇතුළත් වූ බවත් 2023.04.05 දින එම ශල්‍යකර්මය සිදු කිරීමෙන් පසුව නිවසට පැමිණි බවත් ප්‍රකාශ කර ඇත. පසුදින වන විට ශල්‍යකර්මය සිදුකළ ඇසේ විවිධ ආසාධිත තත්ත්වයන් ඇති වූ බැවින් 2023.04.08 වන දින නැවත රෝහල්ගතවී ප්‍රතිකාර ලබාගත් බවත් එහිදී වෛද්‍යවරුන් විසින් ශල්‍යකර්මය සිදුකළ ඇසට විසබීජයක් ගොස් ඇති බව ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. මේවන විට වම් ඇස අන්ධභාවයට පත්වී ඇති බව දක්වා ඇත.

**මධ්‍යම පළාත්වය/ පාර්ශවයේ කරුණු දැක්වීම :**

**රෝහල් අධ්‍යක්ෂ (නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල) :**

නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ රෝහල් අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනවිරත්න මහතා විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද 2023.12.16 දිනැති ලිපිය මගින් මෙසේ ප්‍රකාශ කර ඇත. නුවරඑළිය මහ රෝහලේදී 2023.04.05 වන දින රෝගීන් 33 දෙනෙකු සඳහා ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මයක් ද එක් රෝගියෙකු සඳහා සුළු අක්ෂි ශල්‍යකර්මයක් ද සිදුකර ඇත. මෙම සියලු ශල්‍යකර්ම ආසාදන වැළැක්වීමේ සියලු වන්ද්‍යකෘත පිළිවෙත් අනුගමනය කරමින් සිදුකර තිබේ. එහෙත් ශල්‍යකර්මවලට භාජනය කරන ලද රෝගීන්ගේ ඇස්වල වරින්වර පෙනීමේ සංකූලතා හේතුවෙන් රෝගීන් 18 දෙනෙකු නුවරඑළිය රෝහලට ඇතුළත් වන ලදි. එහිදී මෙම රෝගීන් පිළිබඳව විශේෂ අවධානය යොමුකොට රෝහල් අධ්‍යක්ෂවරයා සහ රෝහලේ ක්ෂුද්‍රජීවී විශේෂඥ වෛද්‍ය නිලධාරී, ආසාද පාලක ඒකකය, තත්ත්ව කළමනාකරණ ඒකකය, අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය ආදී පිරිසකගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කර එමගින් ආසාදන පාලන මූලධර්ම අනුව අවශ්‍ය කටයුතු කළ බව සඳහන් කර ඇත.

ඒ අනුව අදාළ ස්ථාන පරීක්ෂාකර බලා එම ස්ථානයෙහි නිදර්ශකයන් ආසාදිත රෝගීන් සඳහා භාවිතා කරන ලද ඖෂධ වල නිදර්ශකයන් ක්ෂුද්‍රජීවී පරීක්ෂණ සඳහා යොමුකර තිබේ. එහිදී ශල්‍යකර්ම සඳහා භාවිතා කරන ලද Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධයෙහි ක්ෂුද්‍රජීවීන් අඩංගු බවට අනාවරණය කරගෙන ඇත. ඒ අනුව එදින අක්ෂි ශල්‍යකර්ම වලට භාජනය කිරීම හේතුවෙන් ආසාත්මික තත්ත්වයන් ඇති වූ රෝගීන් නැවත නුවරඑළිය රෝහලට පැමිණි බවත්, එසේ පැමිණි රෝගීන්ට මූලික ප්‍රතිකාර ලබාදී ඔහුන්ගෙන් 08 දෙනෙකු කොළඹ ජාතික අක්ෂි රෝහලට ද 05 දෙනෙකු මහනුවර ජාතික රෝහල වෙත ද වැඩිදුර ප්‍රතිකාර සඳහා යොමුකළ බවත්, ඉතිරි 05 දෙනාට මෙම රෝහල මගින් වැඩිදුර ප්‍රතිකාර ලබාදුන් බවත් සඳහන් කර ඇත. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරීන් පැමිණ විමර්ශනයක් සිදුකර ඇති අතර, සංකූලතාවයට ලක්වූ රෝගීන් මෙම රෝහලට කැදවා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෛද්‍ය එස්.කේ. රත්නායක මහතා ඇතුළු කණ්ඩායමක් මගින් 2023.08.01 වන දින විමර්ශනයක් සිදුකළ බව වැඩිදුරටත් සඳහන් කර තිබේ.

**රෝහල් අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල) :**

ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂ විසින් 2023.08.22 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාව මගින් මෙසේ ප්‍රකාශ කර ඇත. ඩී.එම්.එස්. මාලගමගේ රෝගියා 2023.04.06 දින වම් අසෙහි සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සිදුකර ගැනීම සඳහා මෙම රෝහල වෙත ඇතුළත්වී ඇති අතර, ඔහුගේ ඇඳ ඉහපත් අංක 26324/23 වේ. එකී ශල්‍යකර්මය 2023.04.06 දින අක්ෂි ශල්‍ය විශේෂඥ

වෛද්‍ය ජේ. ඩී. ඩයස් මහතා විසින් සිදුකර ඇති අතර, එම ශල්‍ය කර්මයෙන් අනතුරුව Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% (10-PRED-S) Eye Drop සහ Moxifloxacin (Eye Drop) ඖෂධය නියම කර ඇත. 2023.04.07 දින රෝගියා නේවාසික ප්‍රතිකාර අවසන්කර රෝහලෙන් පිටව ගොස් ඇත. 2023.04.13 වන දින උක්ත රෝගියාගේ වම් ඇසෙහි ආසාදිත තත්වයක් හේතුවෙන් නැවත රෝහල් ගතවී ඇත. වාට්ටුවට ඇතුල් වීමෙන් පසු Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% (Eye Drop), Moxifloxacin (Eye Drop), Tropicamide (Eye Drops), Nepafenac (eye Drops), Ciprofloxacin යන ඖෂධ ලබාදී ඇත. 2023.4.17 දින වන විට රෝගියාට ප්‍රමාණවත් සුවතාවයක් ඇති නොවූ බැවින් Moxifloxacin වෙනුවට Gatifloxacin සහ Tobramycin (Eye Drop) දරන ඖෂධ ලබාදී තිබේ. 2023.04.18 වන දින වැඩ බලන අක්ෂි ශල්‍ය වෛද්‍ය කේ.එල්.ඒ.ඩී.ටී. රණසිංහ මහතා විසින් රෝගියාගේ ඇස තුළට බෙහෙත් එන්නත් කිරීම සිදු කරන ලද අතර, ඖෂධ වශයෙන් Vancomycin හා Ceftzedime ලබාදී ඇත. එහෙත් ප්‍රමාණවත් සුවයක් ඒවන විටත් රෝගියාට ලැබී නොමැති බැවින් 2023.4.20 දින අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය ජේ.ඩී. ඩයස් මහතා විසින් නැවත වරක් Interavitreal Injection ලබාදී ඇත. තවද රෝගියාගේ තත්වය යහපත් නොවූ බැවින් 2023.04.20 දින Vitreo Retinal Surgeon වෙත යොමුකිරීම සඳහා කොළඹ ජාතික අක්ෂි රෝහල වෙත මාරුකර යැවීමට කටයුතු කර ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

එමෙන්ම ආර්.කේ.ඩී.එස්. රණවීර මිය සම්බන්ධයෙන් 2025.02.05 දිනැතිව වාර්තාවක් යොමුකරමින්, 2023.04.05 දින සිට 2023.04.07 දක්වා දකුණු ඇසට කාචයක් බද්ධ කිරීමේ සැත්කම සඳහා ඇද ඉහපත් අංක 26299 යටතේ ගම්පහ රෝහලේ දී මෙම අය නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බව අදාළ වාට්ටුවේ රෝගීන් ඇතුළත් කිරීමේ ලේඛනය මගින් තහවුරු වන බව සඳහන් කර ඇත. තවද අදාළ වාට්ටුවේ එවකට විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයා වශයෙන් සේවය කළ විශේෂඥ වෛද්‍ය ජේ.ඩී. ඩයස් මහතා විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂවරයා වෙත 2024.04.09 දිනැතිව යොමුකර ඇති වාර්තාව තුළින්, උක්ත රෝගියාගේ අක්ෂි සැත්කම සඳහා Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% ඖෂධය භාවිතා කිරීම හේතුවෙන් මෙම අයගේ දකුණු ඇස අන්ධභාවයට පත්වී ඇති බවට වාර්තා කර ඇති බව සඳහන් කර ඇත.

එමෙන්ම මෙම කරුණ සම්බන්ධයෙන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරීගේ අංක LO/513/24 හා 2025.01.27 දිනැති ලිපියෙන් කළ දැනුම්දීම අනුව, මෙම රෝගියා ද ඇතුළුව පහත නම් සඳහන්,

1. පී.ජී. සෝමවතී මිය - නො.497/2, ගොයිගම, උඩුගම්පොල.
2. ඩී. එම්. එස් මාලගමගේ මයා - නො. 273/10, අස්ගිරිය, ගම්පහ.
3. පද්මිණී සමරසිංහ මිය - නො. 119/01, අකරවිට, ගම්පහ.
4. ආර්.පී.එච්. වසන්තා මිය - පිටියේගෙදර, බෙම්මුල්ල.

5. ආර්.කේ.එස්. රණවීර මිය - නො. 251/78,කිඹුල්ගොඩ, යක්කල.
6. එච්. රණතුංග මයා - නො. 49, දොඹවල, උඩුගම්පොල.

යන රෝගීන් හය දෙනාගේ තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**කොමිෂන් සභාව විසින් පැමිණිල්ල විභාගයේ දී අනාවරණය වූ කරුණු :**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.07.10 වන දින ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යන වගඋත්තර පාර්ශවයන් කැඳවා මෙම සිදුවීම සම්බන්ධයෙන් විභාගයක් පවත්වන ලදී. එහිදී වගඋත්තර පාර්ශවයන් විසින් ලබාදුන් ප්‍රකාශ හා වාර්තාවල අඩංගු කරුණු පහත පරිදි වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා කොමිෂන් සභාවට වෙත, 2023.04.18 වන දින අක්ෂි ශල්‍යකර්ම වලට භාජනය කරන ලද රෝගීන්ගේ ඇස් අන්ධවීම සම්බන්ධයෙන් කොළඹ ජාතික රෝහල මගින් පළමුව වාර්තා වූ බවත්, අනෙක් රෝගීන් සම්බන්ධයෙන් නුවරඑළිය මහරෝහල මගින් වාර්තාවූ බවත් ප්‍රකාශ කර ඇත. මෙම රෝගීන්ගේ අක්ෂි සැත්කම් සඳහා භාවිතා කරන ලද Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% W/V (අක්ෂි බිංදු) යන ඖෂධය සම්බන්ධයෙන් සොයාබලන මෙන් වෛද්‍ය සැපයුම් අංශය වෙත දැනුම්දී ඇති බවත් නුවරඑළිය මහරෝහල, කොළඹ ජාතික අක්ෂි රෝහල, ගම්පහ මහරෝහල යන රෝහල් වලදී සිදුකරන ලද අක්ෂි ශල්‍යකර්ම වලට භාජනය කරන ලද රෝගීන් මෙසේ ඇස් අන්ධවීමේ තත්ත්වයට ගොදුරුවී ඇති බවට වාර්තාවී ඇති බවත් සඳහන් කර ඇත. මෙම සිදුවීම වාර්තා වූ පසු වෛද්‍ය සැපයුම් අංශය විසින් එම නිෂ්පාදනයේ භාවිතය අත්හිටුවා ඇති අතර සාම්පල විශ්ලේෂණය සඳහා National Medicines Quality Assurance Laboratory වෙත කඩිනමින් යොමුකිරීමට කටයුතු කර තිබේ. නුවරඑළිය මහරෝහලේ අක්ෂි වාට්ටුවේ සිදුවූ මෙම සිදුවීම පිළිබඳව සොයාබැලීම සඳහා 2023.06.13 වන දින සෞඛ්‍ය ලේකම්වරයා විසින් විශේෂ කමිටුවක් පත්කරනු ලැබූ බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කරන ලද කමිටුව මගින් ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තාවේ සඳහන් කරුණු :**

සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා පත්කරන ලද කමිටුව විසින් ලබාදෙන ලද වාර්තාව 2024.07.10 දින විභාගයේදී කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී. එකී කමිටු වාර්තාවේ සඳහන් කරුණු පහත පරිදි වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% Bottles දුරණ ඖෂධය මෙරටට ගෙන්වීම සඳහා 2020.04.29 වන දින ජාත්‍යන්තර ටෙන්ඩරයක් කැඳවා ඇති අතර 2020.11.06 දින ටෙන්ඩරය අවසන් කර ඇත. මෙම ටෙන්ඩරය සඳහා ලන්සු හතක් ලැබූ තිබූ අතර අඩුම ලංසුව ලබාදුන් MS/ Alvita Pharma Pvt Ltd (Manufacture M/S Indian Ophthalmic India) ආයතනය වෙත එම ටෙන්ඩරය ලබාදී ඇත. ටෙන්ඩර් කොන්දේසි අනුව පළමු වන නිෂ්පාදනය නැව්ගත කිරීමට පෙර නියැදි පරික්ෂාවට ලක්විය යුතු වේ. නැව්ගත කිරීමට පෙර නියැදි පරික්ෂාවට යටත්ව MS/ Alvita Pharma Pvt Ltd ආයතනය වෙත ටෙන්ඩරය ලබාදීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. එයට හේතුව නිෂ්පාදකයා විසින් මීට පෙරදී සැපයුම් ලබාදී ඇතත් පසුගිය සැපයුම සහ වත්මන් ටෙන්ඩර් අතර කාල පරතරය වැඩි හේතුවෙන් පෙර නැව්ගත කිරීමේ සාම්පල පරික්ෂා කිරීමට දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

පෙර නැව්ගත කිරීම් කරන ලද සාම්පල N22L16, N22L17, N22L18 අංක දරන කාණ්ඩ ගත කර තිබූ අතර 2022.12.20 දින M/S Bee Pharmo Labs Pvt Ltd විසින් එම වාර්තා නිකුත්කර ඇත. එම පරික්ෂණ වාර්තා 03 අනුව නිෂ්පාදිතයා පරීක්ෂණයෙන් සමත් වී ඇති බැවින්, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් දෙපාර්තමේන්තුවේ විශ්ලේෂණ වාර්තාව තෘප්තිමත් බවට තීරණ කර ඇත. දෙවන කණ්ඩායම N22L16 සහ N22L17 වශයෙන් 2023.02.20 දින නැව්ගත කර ඇත. එම කණ්ඩායම සඳහා 2023.03.03 දින ශ්‍රී ලංකා රේගුව විසින් නිෂ්කාශන වාර්තාව ලබාදුන් පසු එදිනම වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගෙන තිබේ. 2023.04.18 වන දින කොළඹ ජාතික අක්ෂි රෝහල විසින් Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධය භාවිතය හේතුවෙන් සිදුවූ මෙම සිදුවීම පිළිබඳ වෛද්‍ය සැපයුම් අංශය වෙත දැනුම්දී ඇත.

මෙම වාර්තාවේ දක්වන ලද නිරීක්ෂණ පහත පරිදි වේ. කමිටු නියෝජිතයන් මෙම සිදුවීම සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීම සඳහා නුවරඑළිය මහරෝහල වෙත ගොස් වින්දිතයන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා ඇත. 2023.04.04 දින රෝගීන් 34 දෙනෙකු අක්ෂි සැත්කම් සඳහා නුවරඑළිය මහරෝහල වෙත ඇතුළත් කර ඇත. එම රෝගීන් 34 දෙනාගෙන් 18 දෙනෙකු මෙම සිදුවීමට මුහුණදී ඇති බව වාර්තාවේ සඳහන් වේ. විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද පශ්චාත් ශල්‍ය සංකූලතා වාර්තාව අනුව බලපෑමට ලක්වූ රෝගීන්ගේ පෙනීම පිළිබඳ විස්තර එම වාර්තාවේ අන්තර්ගත කර ඇත.

මෙම සිදුවීම හඳුනාගැනීමෙන් පසු ක්ෂුද්‍රජීව විද්‍යාඥයා විසින් මෙකී ඖෂධයේ සාම්පල පහක් ගෙන පරීක්ෂණයට ලක්කර තිබේ. එම පිරික්ෂණය සඳහා BHT No 15063, BHT No 15100, BHT No 15775, BHT No 15067 BHT No 15067 යන කාණ්ඩ මගින් සාම්පල පහක් ගෙන පරික්ෂාවට ලක්කර ඇති බවත්, එම පරික්ෂාවේ දී ක්ෂුද්‍රජීවීන් සිටින බවට හඳුනාගනු ලැබූ N22L16 / N22L17 කාණ්ඩ දෙක ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් කඩිනමින් ඉවත් කර ඇති බවත් උක්ත වාර්තාවේ සඳහන් වේ. තවද ඖෂධ සැපයුම් ක්‍රියාවලියේදී ඉහත ඖෂධ කාණ්ඩ නිසියාකාරව අහඹු

ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණයකට භාජනය කර නොමැති බව එම වාර්තාවේ වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව ඖෂධවල සිදුවී ඇති අහිතරක ඖෂධ ප්‍රතික්‍රියාව හේතුවෙන් මෙම ඖෂධ සපයනු ලබන දේශීය සැපයුම්කරු වෙත ඖෂධ සැපයීම අත්හිටුවන ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2023.04.24 දින දන්වා තිබේ. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මෙම ඖෂධ සැපයුම්කරු සමඟ ගිවිසුමක් පවතින නමුත්, ඖෂධ භාවිතය හේතුවෙන් අන්ධභාවයට පත්වූ වින්දිතයන් වෙත වන්දි ලබාදීම සඳහා එකී ගිවිසුමේ ප්‍රතිපාදන නොමැති බව කමිටුව විසින් නිරීක්ෂණ කර තිබේ. තවද කමිටුව විසින් සඳහන් කර ඇත්තේ ගිවිසුමක් ප්‍රකාරව යම්කිසි භාණ්ඩයක් ගුණාත්මක දෝෂයක් හේතුවෙන් ඉවත් කර ගන්නා විට පහත කරුණු පමණක් අදාළ වන බවයි.

මෙම කමිටුව විසින් සිදුකරන ලද විමර්ශනයේ නිගමනය ලෙස, ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම වලට භාජනය වූ රෝගීන් සඳහා ඉහත සඳහන් කළ අක්ෂි බිංදු භාවිතා කර ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්ම සිදුකර ඇති බවත්, පසුව මෙම රෝගීන්ගේ ඇස්වල endophthalmitis තත්වයක්හට ගෙන ඇති අතර රොගීන්ගේ ඇසේ පෙනීම නැතිවී බවට නිගමන කර ඇත. මෙකී නිගමනය අනුව කිමිටුව විසින් පහත පරිදි නිර්දේශ ලබාදී ඇත.

- මෙම ඖෂධය භාවිතයෙන් රෝගීන්ගේ ඇස් අන්ධභාවයට පත්වීම බරපතල තත්ත්වයක් වන බැවින් මෙම ඖෂධය සම්පූර්ණයෙන් භාවිතයෙන් ඉවත් කිරීම
- මෙම සැපයුම්කරු නිෂ්පාදක අසාදු ලේඛනගත කිරීම (Black List කිරීම)
- සම්පූර්ණ නිෂ්පාදන ප්‍රමාණයේ වටිනාගම සැපයුම්කරු වෙතින් අයකර ගැනීම.
- දුර්වල ගුණාත්මක නොවන නිෂ්පාදන සපයන සමාගම්වලින් වින්දිතයන්ට වන්දි ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් පටිපාටියට ඇතුළත් කිරීම.
- දැනට ඇතිවී ඇති තත්ත්වය හදිසි තත්ත්වයක් ලෙස සලකමින් බඳවා ගැනීමේ විශ්ලේෂණ කාර්යය මණ්ඩලය වැඩි කිරීම මගින් ජාතික ඖෂධ නියාමන අධිකාරය මගින් නිෂ්පාදන වල තත්ත්ව පරික්ෂාව වැඩි කිරීම.
- අදාළ නිෂ්පාදනය ආපසු ගැනීමේදී සපයන ලද සම්පූර්ණ කාණ්ඩ ප්‍රමාණයේ වටිනාකම සැපයුම්කරු වෙතින් අය කරගනු ලැබේ. නිෂ්පාදන ආපසු ගැනීමේදී සපයන ලද සම්පූර්ණ නිෂ්පාදන ප්‍රමාණයේ වටිනාකම සැපයුම්කරු වෙතින් අය කර ගනු ලැබේ. උක්ත ක්‍රමවේද දෙකෙහිම 25% ක පරිපාලන අධිභාරයක් සහිතව ගුණාත්මකභාවය පහත වැටුණු සැපයුම් සඳහා මුළු පිරිවැය සැපයුම්කරුට අධිභාරය කළ යුතුය.

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිගමන :**

1. මෙම වින්දිතයන් අන්ධබාවයට පත්වී ඇත්තේ ඔවුන්ට සිදු කරන ලද අක්ෂි ශල්‍යකර්ම වලදී ලබාදෙන Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධය ඇතුළත් N 22L16 – 33775 – 5ml Dropper Bottle සහ N 22L17 – 16225 -5ml Dropper Bottle යන කාණ්ඩ දෙකෙහි ක්ෂුද්‍රජීවීන් අඩංගුවීම හේතුකොටගෙන බව වෛද්‍ය පරීක්ෂණ මගින් තහවුරුවී ඇත.

2. මෙම වින්දිතයන් ශල්‍ය කර්මවලට භාජනය කිරීමට පෙර Prednisolone Acetate Ophthalmic Suspension නැමති ඖෂධයේ ක්ෂුද්‍රජීවීන් අඩංගුවී තිබූ බවට හඳුනාගැනීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් හා / හෝ පරීක්ෂා නොකිරීම හේතුවෙන්, වගඋත්තර පාර්ශවයන් වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මේ සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් ලෙස ඔවුන්ගේ වගකීම නිසි පරිදි ඉටුකර නොමැති බවට නිරීක්ෂණය වේ.

3. නුවරඑළිය දිස්ත්‍රික් මහරෝහලේදී අක්ෂි ශල්‍යකර්මවලට භාජනය වූ රෝගීන් 18 දෙනෙකුගේ පෙනීම අහිමි වීම හේතුවෙන් ඔවුන් වෙත වන්දි මුදලක් ලබාදීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඇති බවත් එය අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකිරීමට නියමිත බවත් නිරීක්ෂණය වේ. 2024.01.24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිරීක්ෂණවල 04 (iv) යටතේ, "මෙම වින්දිතයන් සඳහා කඩිනමින් කරුණා සහගත දීමනාවක් නිසි ක්‍රමවේද අනුව ගණනය කර ලබාදීමටත් පසුව ඖෂධ නිෂ්පාදකයා වෙතින් වන්දි ලබාගැනීමෙන් පසු පියවා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් යෝජනා කරමි" යනුවෙන් දක්වා ඇති අතර, ඒ යටතේ මෙකී වන්දි ලබාදීමට තීරණ කර ඇති බවට නිරීක්ෂණය වේ.

4. එහෙත් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගම්පහ මහරෝහලේදී අක්ෂි ශල්‍යකර්මයක් සිදුකිරීම හේතුවෙන් අන්ධබාවයට පත්වූ ඩී. එම්. එස්. මාලගමගේ සහ ආර්.කේ.ඩී.එස්. රණවීර යන අයගේ නම මෙම අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට යොමුකරන ලද ලේඛනයේ සඳහන්ව නොමැත. මේ සම්බන්ධයෙන් ගම්පහ මහරෝහලේ අධ්‍යක්ෂ වෙතින් විමසීමේ දී එම වින්දිතයන් ගම්පහ රෝහලේ ප්‍රතිකාර ලබාගත් බවට වාර්තාවක් යොමුකර ඇත. තවද ඒ. ජී. වීරකෝන් යන අයගේ නම ද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද ලේඛනයේ නොමැති බවට නිරීක්ෂණය වේ. මෙම වින්දිතයන් තිදෙනාගේ නම් ලේඛනයට ඇතුළත් නොවීම හේතුවෙන් ඔවුන්ට අගතියක් සිදුවිය හැකි බැවින් ඒ පිළිබඳව විමර්ශනය කළයුතු බව නිරීක්ෂණය වේ.

5. එමෙන්ම 2025.02.05 දිනැතිව ගම්පහ දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂ විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද ලිපියෙහි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරී වෙත 2025.02.03 දිනැතිව යොමුකරන ලද ලිපියෙහි, උක්ත නම් සඳහන් වින්දිතයන් 21 දෙනාට අමතරව ගම්පහ රෝහලේ දී සිදුකරන ලද අක්ෂි සැත්කම් සඳහා භාවිතා කරන ලද Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධය හේතුවෙන් තවත් රෝගීන් සිව් දෙනෙකුගේ ඇස් අන්ධවී ඇති බවට වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ තැනැත්තන් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට යොමු කළ ලේඛනයේ නම් සඳහන් තැනැත්තන්ට අමතරව මෙකී ගැටලුව හේතුවෙන් අගතියටපත් තවත් පිරිසක් සිටින බවට නිරීක්ෂණය වේ.

6. කෙසේ නමුත් මෙම සිදුවීම හේතුවෙන් අන්ධභාවයට පත් වූ තැනැත්තන් සඳහා අමාත්‍යය මණ්ඩල සංදේශය මගින් ලබාදීමට නියමිත වන්දි මුදල් ප්‍රමාණය ඔවුන්ට සිදුවී ඇති හානියේ ප්‍රමාණය අනුව ප්‍රමාණවත්වේද යන්න සම්බන්ධයෙන් නිශ්චය කළ යුතු බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

7. Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධය මෙරටට ගෙන් වූ පසු සාම්පල පරික්ෂාවක් නිසි පරිදි සිදු කර නොමැති බවට නිරීක්ෂණය වේ. මෙකී සිදුවීම වාර්තාවූ පසු මෙම ඖෂධයේ සාම්පල පරික්ෂාවට ලකර කර ඇති නමුත් රෝහල් වෙත බෙදාහැරීමට පෙර සාම්පල පරික්ෂාවක් සිදුකර නොමැත. එසේ සාම්පල පරික්ෂා කිරීමේ ක්‍රමවේදයක් ද ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතුව නොමැති බවට නිරීක්ෂණය වේ.

8. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ඖෂධ සැපයුම්කරුවන් සමග ඇතිකර ගනු ලබන ටෙන්ඩර් ගිවිසුම්හි අදාළ ඖෂධවල ප්‍රමිතියේ හෝ ගුණාත්මකභාවයේ ගැටලුවක් උද්ගතවුවහොත් එම ඖෂධ භාවිතා කිරීමෙන් අගතියට පත්වන රෝගීන් සඳහා ලබාදෙන සහන පිළිබඳව ඇතුළත් කර නොමැත.

9. මෙම සිදුවීම සම්බන්ධයෙන් සොයාබැලීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද කමිටුවේ පරික්ෂනය අනුව Prednisolone Acetate Ophthalmic Suspension නැමති ඖෂධය භාවිතා කර ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සිදුකර ඇති අතර එම ඖෂධලයේ ක්ෂුද්‍රජීවීන් අඩංගුවීම හේතුවෙන් රෝගීන් අන්ධභාවයට පත්වී ඇති බවට නිගමනය කර ඇති අතර, එම කමිටුව විසින් ඒ සඳහා උක්ත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

උක්ත කරුණු අනුව වගඋත්තර පාර්ශවයන් විසින් ඔවුන්ගේ වගකීම නිසිපරිදි ඉටු නොකිරීම හේතුවෙන් මෙකී වින්දිතයන් සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත පරිදි නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

**නිර්දේශ :**

1. මෙම පැමිණිල්ලේ සඳහන් 01 සිට 20 දක්වා සඳහන් කර ඇති වින්දිතයන්ගේ ඇස් අන්ධභාවයට පත්වීම හේතුවෙන් ඔවුන්ගේ ජීවිතවලට හා අනෙකුත් එදිනෙදා කටයුතු වලට බලපාන ආකාරය පිළිබඳව විධිමත් තක්සේරුවකින් පසු ඔවුන් වෙත සුදුසු හා ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට රජයට නිර්දේශ කරනු ලැබේ.

2. උක්ත නම් සඳහන් වින්දිතයන්ට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරන ලද විමර්ශන වලදී අනාවරණය කරගත් හා / හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැමිණිලි යොමුකරන ලද වින්දිතයන් සම්බන්ධයෙන් ද සොයාබලා කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් ක්‍රමවේදය යටතේම එකී වින්දිතයන් වෙත ද සුදුසු හා ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

3. Prednisolone Acetate Ophthalmic Suspension USP 1.0% නැමති ඖෂධය ගෙන්වීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ දී අනුගමනය කළ යුතු ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය වන ආකාරයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ. එබැවින් ටෙන්ඩර් පටිපාටියට අදාළව කටයුතු කරනු ලැබූ නිලධාරීන් සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධයෙන් සියලුම වගකිය යුතු නිලධාරීන්ට සහ මේ සම්බන්ධයෙන් අධීක්ෂණ හා පසුවිපරම් කටයුතු සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව ද විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

4. උක්ත නිර්දේශ වලට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම සිදුවීම පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් ලබාදෙන ලද කමිටු නිර්දේශ ද ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

2025. .04.09..... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව 05, 06 සහ 07 වන වගඋත්තර පාර්ශවයන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වේ.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
කොළඹ 10.